*සැ. යු.*— 2006.03.31 වැනි දින පළකරන ලද අංක 1,439 දරන *ගැසට් පත්‍රයෙහි* IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,440- 2006 අප්‍රේල් 07 වැනි සිකුරාදා - 2006.04.07**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ජේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 263 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 262 | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 262 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 264 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.*– (i) බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 2006 පෙබරවාරි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ඔට්ටු ඇල්ලීම සහ සුදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2006 පෙබරවාරි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධන) පනත් කෙටුම්පත 2006 මාර්තු මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 අප්‍රේල් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 මාර්තු මස 31 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 79

ජනා. කා. අංකය : ඒඩීඑෆ්/ඒ7/2005(22).

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(1) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර 2006.03.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II පංතියේ, චන්දිමා වික්‍රමසිංහ මෙනවිය සහකාර ලේකම්වරියක වශයෙන් ජනාධිපති කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබ ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2006 මාර්තු මස 22 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

04-125

2006 අංක 78

ජනා. කා. අංකය : ඒඩීඑෆ්/ඒ7/2005(22).

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(1) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර 2006.03.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පංතියේ, ඩබ්ලිව්. ජේ. ආනන්ද මහතා ජොෂ්ඨ සහකාර ලේකම්වරයෙකු වශයෙන් ජනාධිපති කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබ ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2006 මාර්තු මස 20 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

04-126

# වෙනත් පත්කිරීම් ආදිය

2006 අංක 80

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත් කිරීම්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ එච්. ආර්. එස්. එස්. යාපා මහත්මිය 2005.10.18 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ආයතන අධ්‍යක්ෂවරියක වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ චිත්‍රා රණසිංහ මහත්මිය 2005.10.18 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස් වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ එස්. ජයවර්ණ මහත්මිය 2005.10.18 දින සිට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරිපාලන නිලධාරී වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ ටී. ගුණසේන මහතා 2005.10.20 දින සිට නැවත නියමයක් කරන තුරු සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ ඩබ්ලිව්. එස්. අයි. විජේසේකර මහතා 2005.10.19 දින සිට නැවත නියමයක් කරන තුරු සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ එච්. පී. සුමනසේකර මහතා 2005.04.04 දින සිට නැවත නියමයක් කරන තුරු තැපැල්, විදුලි සංදේශ හා උඩරට සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ ඒ. එච්. එල්. ද සොයිසා මහතා 2005.11.28 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂවරයෙක් වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ කේ. ඩී. සී. ප්‍රනාන්දු මහත්මිය 2005.10.18 දින සිට නැවත නියමයක් කරන තුරු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ ඩබ්ලිව්. එම්. එම්. ආර්. අධිකාරි මහත්මිය නැවත නියමයක් කරන තුරු 2006.01.19 දින සිට සමෘද්ධි හා දිළිඳුකම පිටුදැකීමේ අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ බී. එච්. එන්. ජයවික්‍රම මහතා 2006.01.05 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන් ;

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ ආර්. එම්. රංජිත් කුමාරදාස මහතා 2005.10.18 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2006 මාර්තු මස 22 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

04-129

# ආණ්ඩුවේ නිවේදන

## 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණය හිමියන් වෙත ආඥාපනතේ 25(1), 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. ඩබ්ලිව්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2006 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 02, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ල,
දෙවන මහල, අංක 90 දරන ස්ථානයේ පිහිටි,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම හා ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (1) 40171 | වාසල මුදියන්සේලාගේ අශෝක කුලරත්න බණ්ඩාර මයා<br>මාලිගාතැන්න,<br>තලගස්වත්ත,<br>නිල්දණ්ඩාහින්න | යාපා මුදියන්සේලාගේ අයිරාංගනී යාපා මිය<br>උඩවෙල,<br>නිල්දණ්ඩාහින්න<br>මැද පළාත,<br>වලපනේ |
| (2) 40177 | පැල්පොලගේ දොන් සමරපාල පේමසිරි ගුණතිලක මයා<br>අංක 119ඞී,<br>පොල්හේන,<br>කැළණිය | කනිප්පුලි අච්චිගේ නොහොත් කනිප්පුලි ආරච්චිගේ නිමල් ජයසිංහ මයා<br>පන්සල පාර,<br>ජම්බුරලිය,<br>මඩපාත |
| (3) 40193 | ගල්කැටි දේවගේ චාන්දනී අමරසිංහ මිය,<br>අංක 42/ඒ,<br>වැල්හේන,<br>මිනුවන්ගොඩ | වලිමුණි දේවගේ සෝමපාල මයා<br>අංක 2/41,<br>වැල්හේන,<br>මිනුවන්ගොඩ |
| (4) 40205 | මුතුකුඩ ආරච්චිගේ කරුණාවතී මිය,<br>මූකලංයාය,<br>කුලි/කිරින්දව | කරුණානායක මුදියන්සේලාගේ නිලන්ත කුමාර මයා,<br>මූකලංයාය,<br>කුලි/කිරින්දව |
| (5) 40212 | සේනානායක පුල්ලිකුට්ටි මුදියන්සේලාගේ එරික් පෙරේරා මයා,<br>පනාවත්ත පාර,<br>ගරාගොඩ,<br>යටියන්තොට | දියෝගු හැන්නැදිගේ සෝමසිරි මයා<br>පනාවත්ත පාර,<br>ගරාගොඩ,<br>යටියන්තොට |
| (6) 40226 | රංචාගොඩ ආරච්චිගේ ප්‍රියාශා සරෝජිනී කරුණාරත්න මිය<br>අංක 491, රෝහල පාර,<br>වලගෙදර,<br>බලපිටිය | ගුණවර්ධන ආනන්ද සොයිසා මයා<br>අංක 9/2/2,<br>වාරිමාර්ග මහල් නිවාස,<br>කඳවල පාර,<br>රත්මලාන. |

04-77

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/28038/සීබී8/929.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.04.29 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන කේ. ඥාණසිරි සහ එස්. සමරසිංහ විසින් සහතික කරන ලද, 1996.01.06 සහ 1997.03.13 දින හා අංක 4240 දරන උකස් බැඳුම්කරය සහ අංක 3313 දරන ද්විපාර්ශ්වික ඔප්පුව මත අය වියයුතු මුදල් ගෙවීම, තලංගම පදිංචි නවගමුවගේ ෂෙල්ටන් ජයසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.03.23 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ පනස් හතර දහස් පන්සිය අසූ හතයි ශත දහයක (රු. 5,54,587.10) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 4240 හා අංක 3313 දරන ද්විපාර්ශ්වික ඔප්පුව ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අනූ දෙකයි ශත තිස් දෙක (රු. 192.32) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, කටුවාවල, තුන්වෙනි පටුමගෙහි, අංක 21/10ඒ හි බලයලත් වෙන්දේසිකාර එෆ්. ආර්. ගල්හේන මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, ඔරුවල පිහිටි එගොඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් මැන සාදන ලද 1995.05.11 දින හා අංක 4817 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 3ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප.9.9 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද, එකී මිනුම් පිඹුරේ කැබලි අංක 3 බී හා 2 බී මතින් සහ ඒ.ආර්. ඩයස් අබේගුණවර්ධන මිනින්දෝරු තැනගේ අංක 2854 හා 1960.06.19 දින දරන පිඹුරේ කැබලි අංක 4 මතින් ද ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-103/9

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 2/74940/කේ 2/897.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.14 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1.කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. අයි. ගුණවර්ධන විසින් සහතික කරන ලද, 2004.03.30 දින හා අංක 3172 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, කැළණිය පදිංචි අතාවුද රාලලාගේ සුසිල් ආනන්ද යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.10.06 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හයලක්ෂ අනූහත් දහස් හාරසිය හතලිස් තුනයි ශත අසූහතරක ( රු. 6,97,443.84) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3172 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය දාහතයි ශත අසූවක් (රු. 217.80) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී.එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, (කැළණිය උප කාර්යාලය) කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ කැළණිය පිහිටි කලුදේවාල පාරේ වරිපනම් අංක 54 දරන මිල්ලගහවත්ත සහ නාගහහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බී.එස්. අලහකෝන් විසින් සකසන ලද 2004.01.01 දිනැති හා අංක 3087 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ. 0, ප. 12.50ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-103/7

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/42864/එච්6/406.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.09.23 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1.පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. කරුණාසේන විසින් සහතික කරන ලද, 2001.07.13 දින හා අංක 3194 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි යක්දෙහිකන්දගේ සුසිල් ප්‍රේමරත්න කොස්තා සහ දික්වැල්ලේ පටබැඳිගේ ඉන්ද්‍රානී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2004.08.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ විසිපන්දහස් දෙසිය හැටඅටයි ශත එකක (රු. 2,25,268.01) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3194 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අනූනවයයි ශත විසිහතක (රු. 99.27) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ උඩහමුල්ල පට්ටිය පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ඒ. ඊ. ජේ. සිල්වා විසින් මැන සකසන ලද 1977.08.23 දින හා අංක 712 දරන පිඹුරේ දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ.0, ප . 17.75 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස් සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මාර්තු මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

04-103/8

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ණය අංකය 16259/18 සහ 16768/17.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.09.05 දින පවත්වන ලද රැස්වීමේදී මෙහි පහත දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දින දරන පනතින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ :

"ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ක්‍රිෂාන්ති පලිහක්කාර විසින් ලියා සහතික කරන ලද අංක 2280 හා 2440 සහ පිළිවෙලින් 1996.11.22 වැනි දින හා 1997.05.19 දින දරන උකස් බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරු වන (අම්බලන්ගොඩ, ඇල්පිටිය පාර, අංක 57/4 හි කලින් පදිංචිව සිටි) බලපිටිය, වලගෙදර, ගාලු පාර අංක 587/1 හි ගිරිපුර සෙනරත් පලිහවඩනගේ චන්ද්‍රගුප්ත අබේසේකර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කර මත 2005.09.10 වැනි දිනට රුපියල් අටලක්ෂ තිස්දහස් නවසිය තිහකුත් ශත හැට දෙකක (රු. 8,30,930.62) ක මුදලක් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එක් (රු. 8,30,930.62) ක මුදල සහ 2005.09.10 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් පොළියද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද, ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2280 හා 2440 දරන බැඳුම්කර මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස්කර ඇති මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි."

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, බලපිටිය ප්‍රාදේශීය සභා ප්‍රදේශ සීමාව ඇතුළත, බලපිටියේ, වලගෙදර පිහිටි එගොඩවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ජී. මැන්ඩිස් විසින් මැන සාදන ලද අංක 1053 හා 1981.08.04, 1981.09.26 සහ 1981.10.05 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : රේනරාලට අයිති ඉඩම් ද, නැගෙනහිරට : ලොට් අංක 2 ද, දකුණට : පාරක් සඳහා වෙන්කළ ලොට් අංක 26 ද, බස්නාහිරට : දිනාලගෙවත්ත ද යන මායිම් ඇතුළත එකී අංක 1053 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වය ඇති ඉඩම. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 126/241 පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

කළමනාකරු-ණය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලුපාර,
කොළඹ 3.

04-96

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ණය අංකය 22404/13.5.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.03 දින පවත්වන ලද රැස්වීමේදී මෙහි පහත දැක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දින දරන පනතින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ :

"ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. එම්. ඒ. සී. ජේ. එස්. කේ. සේනාරත්න විසින් ලියා සහතික කරන ලද අංක 634 හා 2000.06.26 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරු වන පිළියන්දල, ගඩබුවාන, සීකෝ ගාඩින්ස් අංක 118 හි මොහොමඩ් රියාස් කමල් යන අය විසින් පැහැර හැර ඇති හෙයින්ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2005.11.25 වැනි දිනට රුපියල් එක්ලක්ෂ විසිනව දහස් තුන්සිය හැට දෙකකුත් ශත හැත්තෑ හතරක (රු. 1,29,362.74) ක මුදලක් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක් ලක්ෂ විසිනව දහස් තුන්සිය හැට දෙකකුත් ශත හැත්තෑ හතරක් (රු. 1,29,362.74) ක්වූ මුදල සහ 2005.11.25 දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට දහතුනකුත් දශම පහ (13.5%) බැගින් පොළිය ද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද, ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී අංක 634 දරන බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස්කර ඇති මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි."

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත. මාදුලුවාවේ පිහිටි තිල්වත්ගල එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද අංක 2169 හා 1998.10.14 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 9 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 10 ද, නැගෙනහිරට : ලොට් අංක 17 ද, දකුණට : ලොට් අංක 8 ද, බස්නාහිරට : ඩී. යූ. ජයසූරියට අයිති දේපළ ද යන මායිම් ඇතුළත එකී අංක 2169 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වය ඇති බිම් කට්ටිය සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන්. 215/190 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙයට ලොට් අංක 17 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් වූ බිම) සහ එකී අංක 2169 දරන පිඹුරේ දැක්වෙන පාරවල් සඳහා වෙන් වූ බිම මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය සහ වෙනත් අයිතිවාසිකම් ද (සුභසාධක කටයුතු සඳහා වෙන් වූ) ලොට් අංක 60 කෙරෙහි ඇති අයිතිවාසිකම් ද ඇතුළත් වේ.

කළමනාකරු-ණය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලුපාර,
කොළඹ 3.

04 - 97

---

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ණය අංකය : 17919/15/3.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.13 දින පවත්වන ලද රැස්වීමේදී මෙහි පහත දැක්වෙන යෝජනාව ඒකච්ඡන්දයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දින දරන පනතින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ :—

"ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ක්‍රිෂාන්ති පලිහක්කාර විසින් ලියා සහතික කරන ලද අංක 2806 හා 1998.05.06 දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරු වන හොරණ, මූනගම, ජයතිලකවත්තේ, ජනක රුවන් කුමාර නාවින්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින්ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2005.10.10 වැනි දිනට රුපියල් එක්ලක්ෂ හැටඅට දහස් තුන්සිය අසූහතයි ශත පනස් එකක (රු. 1,68,387.51) ක මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක්ලක්ෂ හැටඅට දහස් තුන්සිය අසූහතකුත් ශත පනස් එකක් (රු. 1,68,387.51) ක්වූ මුදල සහ 2005.10.10 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් වූ පොළිය ද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද, ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2806 දරන බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස්කර ඇති මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි."

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුකහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභාවේ වැතර උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, කහතුඩුවේ පිහිටි හීතවලදෙනිය නොහොත් ඕබඩ දෙනිය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් මැන සාදන ලද අංක 1163 හා 1997.03.26 දින දරන පිඹුරේ දැක්වෙන අංක 34 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් ආර් 5 (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කළ බිම) ද, නැගෙනහිරට : ලොට් අංක 33 ද, දකුණට : ලොට් අංක 32 සහ ලොට් ආර් 10 (කාණුව) ද, බස්නාහිරට : ලොට් අංක 35

ද යන මායිම් ඇතුළත එකී අංක 1163 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ (දැනට හෝමාගම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 253/276 පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇත.

මෙයට එකී අංක 1163 දරන පිඹුරේ ආර් 3 සහ ආර් 5 ලෙස ලකුණු කළ පාරවල් සඳහා වෙන් වූ බිම මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

කළමනාකරු-ණය,

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලුපාර,
කොළඹ 3.

04-95

---

## පීජ්බීසී බැංකුව-මෙට්රෝ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. ෆුවාඩ් විසින් සහතික කරන ලද 1996.12.17 දින හා අංක 2483 දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වී. එගොඩගේ විසින් සහතික කරන ලද 1999.04.16 දින හා අංක 24 දරන උකස් බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් සහතික කරන ලද 2003.10.23 දින හා අංක 1386 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජී. ජී. පල්ලියගුරුගේ විසින් 2005.06.29 දින හා අංක 129 දරන උකස් බැඳුම්කර මත පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් (කලින් පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ) වෙත වසර දෙදහස් පහේ (2005) නොවැම්බර් මස 14 වැනි දිනට දැන් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති රුපියල් තුන්සිය පන්ලක්ෂ පනස් දෙදහස් තුන්සිය හැට නවයයි ශත පනස් හතක් (රු. 30,552,369.57) වූ මුදල් බැඳුම්කරුවන් වශයෙන් වයඹ ට්‍රේඩර්ස් යන ව්‍යාපාර නාමය යටතේ හවුල් ව්‍යාපාරයක් කරගෙන යන සේගු අබ්දුල් කාදර් වහිඩා රහමාන් සහ ෂාහුල් හමීඩ් සදිකින් සහ උකස්කරු වශයෙන් ඉහත සඳහන් ෂාහුල් හමීඩ් සදිකින් විසින් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් ඉහත කී රුපියල් තුන්සිය පන් ලක්ෂ පනස් දෙදහස් තුන්සිය හැට නවයය ශත පනස් හතක් (රු. 30,552,369.57)ක මුදල සමහ රුපියල් පනස් තුන්ලක්ෂ පනස් තුන්දහස් නවසිය අනූ හතයි ශත හතළිස් හතක (රු. 5,353,997.47)ක මුදල සඳහා වසරකට සියයට තිස් එකක (31%) පොලිය සහ රුපියල් දෙකෝටි තිස් ලක්ෂයක් (රු. 2,30,00,000) මුදල සඳහා වසරකට සියයට විසි දෙකක (22%) පොලිය ද, 2005.11.15 දින සිට වි කිණීමේ දින දක්වාද පළාත් අධිකාරී බදු ද, මෙම මුදල් ප්‍රමාණයෙන් යම් මුදලක් මේ වන විට ගෙවා ඇත්නම් එම මුදල් ප්‍රමාණය අඩුකොට පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් ලිමිටඩ් මගින් ප්‍රචාරක හා විකිණීමේ කටයුතු සහ ගාස්තු වශයෙන් වූ වියදම් සඳහා වැය කරන ලද සියළු මුදල් සමහ ඉහත සඳහන් අංක 2483, 24, 1386 සහ 129 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥාවන්ට අනුකූලව හා 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර අයකර ගැනීම සඳහා පහත දැක්වෙන පළමුවන උපලේඛනයේ එකී අංක 2483 හා අංක 24 සහ දෙවන උපලේඛනයේ එකී අංක 1386 හා 129 දරන උකස් බැඳුම්කර මගින් පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් ලිමිටඩ් වෙත උකස් කරන ලද හා එම උපලේඛනවල වඩාත් මැනවින් විස්තර කර ඇති දේපළ සහ ස්ථාන බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, කොළඹ මහ නගර සහා බල ප්‍රදේශය තුළ බටහිර අළුත්කඩේ අංක 17 කොට්ඨාසයේ පීර් සයිබු වීදියේ වරිනම් අංක 86 ස්ථානයේ ලොට් "ඒ" වශයෙන් ලකුණු කොට ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් සාදන ලද අංක 6685 හා 1996 නොවැම්බර් මස 21 දින දරන පිඹුරේ දැක්වෙන පරිදි මායිම්, උතුරට : පීර් සයිබු වීදියේ වරිපනම් අංක 90, 90/1 සිට 90/7 පිහිටි වත්ත, පරණ යොන් වීදියේ වරිපනම් අංක 202, 204 හා 206 සහ උසාවිය පාරේ වරිපනම් අංක 62 ද, නැගෙනහිරට : උසාවිය පාරේ වරිපනම් අංක 62 සහ අංක 64 ද, දකුණට : පීර් සයිබු වීදියේ වරිපනම් අංක 84 සහ උසාවිය පාරේ වරිපනම් අංක 64 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඒ. රෙක්ස් ෆොන්සේකා විසින් සාදන ලද අංක 2100 හා 1993.07.21 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 7ඒ සහ ලොට් 1ට මායිම්ව පිහිටි ඉහත දැක්වෙන අංක 6685 දරන පිඹුර අනුව පර්චස් පහළොවයි දශම බිංදුව හත (අ. 0, රූ. 0, පර්. 15.07) හෝ හෙක්ටයාර් 0.03811 විශාලත්වය ඇති ඉඩම, එහි පිහිටි ගොඩනැගිලි සහ සියළු දේ සමහ.

ඉහත සඳහන් පිඹුරු අංක 6685 ලකුණු කොට ඇති ලොට් "7ඒ" හි මාර්ගය සඳහා වෙන්කොට තිබෙන කොටස ද ඇතුළත්ය.

#### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හා මහ නගර සහා බල ප්‍රදේශය තුළ මාලිගාකන්ද කොට්ඨාසය නමින් කලින් හැඳින්වූ නැගෙනහිර කුප්පියාවත්ත කොට්ඨාසයේ මාලිගාකන්ද පාරේ වයිට් පාර්ක් හි වරිපනම් අංක 1 (කොටසක්) දරන ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති බෙදා වෙන් කරන ලද (සර්වේයර් ජනරාල් විසින් සාදන ලද අංක 3 දරන පිඹුරේ ලොට් අංක 1 සහ 1947 මාර්තු මස 08 දින දරන අංක 4 රජයේ ඉඩම් පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 සහ රජයේ ඉඩම් පිඹුරුවල ඉහත සඳහන් ලොට් 2 අතර පිහිටි ඉඩම ද, ඒකාබද්ධ කර නැවත බෙදන ලදී) කොටස මායිම්, උතුරට : ලොට් 3 ද, නැගෙනහිරට : වයිට් පාර්ක් හා වරිපනම් අංක 1 දරන කොටසෙහි ඉතිරි ය, දකුණට : ලොට් 1 ද, බස්නාහිරට : ලොට් 13ට මායිම්ව පිහිටි බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සාදන ලද අංක 96 හා 1988 අගෝස්තු මස 03 දින දරන පිඹුර අනුව පර්චස් අටයි දශම බිංදුවයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 8.02) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි බිංදුවයි තුනක (හෙක්ටයාර් 0.0203) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි වගාව, ගස් ආදිය සියල්ල සමහ.

ඉහත සඳහන් මැතදී මිණුම් කරන ලද අංක 96 දරන පිඹුරේ ලොට් 2 පහත සඳහන් පරිදි සවිස්තරාත්මවකව දැක්වේ :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කය හා මහ නගර සහා බල ප්‍රදේශය තුළ මාලිගාකන්ද කොට්ඨාසය නමින් කලින් හැඳින්වූ නැගෙනහිර කුප්පියාවත්ත කොට්ඨාසයේ මාලිගාකන්ද පාරේ (වයිට් පාක්) වර්තමාන වරිපනම් අංක 181/25හි පිහිටි (කලින් මාලිගාකන්ද පාරේ වයිට් පාර්ක් හි වරිපනම් අංක 1 (කොටස) යනුවෙන් භාවිතා කළ) (බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සාදන ලද අංක 96 හා 1988 අගෝස්තු මස 03 වැනි දින දරන පිඹුරේ එක හා සමාන ලෙස හැඳින්වූ ලොට් අංක 2 ) බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී පෙරේරා විසින් සාදන ලද අංක 61/94 හා 1994 අගෝස්තු මස 24 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද ලොට් අංක 2 මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සාදන ලද අංක 96 හා 1988 අගෝස්තු මස 3 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 3, නැගෙනහිරට : වයිට් පාර්ක් හි වරිපනම් අංක 1හි ඉතිරි කොටස

දකුණට : බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සාදන ලද අංක 96 හා 1988 අගෝස්තු මස 3 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 සහ බටහිරට : බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සාදන ලද අංක 96 හා 1988 අගෝස්තු මස 3 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 13ට මායිම්ව පිහිටි ඉහත සඳහන් පිඹුරු අංක 61/94 අනුව පර්චස් අටයි දශම බිංදුවයි දෙක (අ. 0, රූ. 0, පර්. 8.02) හෝ හෙක්ටයාර් 0.0203 විශාලත්වයෙන් යුතු ඉඩම සහ බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් සාදන ලද අංක 96 හා 1988 අගෝස්තු මස 3 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 13 කොටසේ මාර්ග අයිතිය ද සමඟ,

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ඩී. වරුනි එගොඩගේ,
කළමණාකාරිණිය (නීති).

04-87

---

# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

ණය අංකය 1/40272/සීඩී5/875

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2005.08.22 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පියදාස හලැල්ල විසින් සහතික කරන ලද 2000.07.21 දින හා අංක 303 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම මඩපාත පදිංචි දන්කොලුගේ දොන් මුණිදාස යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.07.11 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැට අට දහස් දාහතයි ශත අනූ හතර (රු. 268,017.94) ක මුදලක්ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 303 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අනූ එකයි ශත එක (රු. 91.01) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ ජඹුරලිය පිහිටි ඉල්ලගහකනත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ලාල් ගුණසේකර විසින් මැන සකසන ලද 1984.08.14 දින සහ අංක 960 දරන පිඹුරේ කැබලි අංක 7 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ. 0, පර්. 15 ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද, එකී අංක 960 දරන පිඹුරේ කැබලි අංක එෆ් අඩි 20 ක් පළල මාර්ග ප්‍රවේශය ද එච්. ලාල් ගුණසේකර බලයලත් මිනින්දෝරු තැනගේ 1985.02.02 දින හා අංක 1121 දරන පිඹුරේ කැබලි අංක 11 මගින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරි.

2006 මාර්තු මස 04 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

04-103/10

---

# සීමාසහිත සම්පත් බැංකුව

## 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0046 1000 0032.

2005 ජුනි මස 29 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බණ්ඩාරවෙල, බදුල්ල පාරේ තන්තිරියේ අංක 343, දැනට අංක 611 හි කුල් වේව් රිෆ්රිජරේටර් ඉංජිනියරින් වර්ක්ස් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ එකම අයිතිකරු වශයෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන යන බණ්ඩාරවෙල විශාකා මාවත, අංක 77/4 අබ්දුල් ගෆූර් ෆයිරූස් නැමැති අය බන්ධනදායී වශයෙන්, බණ්ඩාරවෙල බලයලත් මිනින්දෝරු එම්. සී. ජේ. පීරිස් විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2003 මැයි 12 දාතම හා අංක 11375 දරන බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2005 අප්‍රේල් මස 26 වන දිනට එකී බැඳුම්කරය මත ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙලක්ෂ දහනව දහස් හත්සිය හතලිස් හතරයි ශත හතලිස් හතරක (රු. 219,744.44) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් දෙලක්ෂ දහනව දහස් හතලිස් හතරයි ශත හතලිස් හතරක (රු 219,744.44) සම්පූර්ණ හිඟ මුදල සමග රුපියල් එක් ලක්ෂ අනූනව දහස් හයසියයක (රු. 199,600) මුදල සඳහා වසරකට සියයට දහනවය (19%) බැගින් 2005 අප්‍රේල් 27 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 11375 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

## උපලේඛනය

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මැදිකිඳ මහ පළාත කෝරලේ, බණ්ඩාරවෙල නගර සභා සීමාව තුළ පිහිටි ඇස්වැද්දුමපතන නමින් හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එම්. සුමතිරත්න විසින් සාදන ලද 2000 අප්‍රේල් 29 දාතම හා අංක 948 දරන පිඹුරේ ලොට් P 3 ලෙසින් නමුත් වඩාත් නිවැරදිව ලොට් 3 වශයෙන් ලකුණු කොට නිරූපිත බදුල්ල දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව J113/252 යටතේ ලියාපදිංචි කර ඇති, උතුරට : එකී අංක 948 පිඹුරේ ලොට් 2 ද නැගෙනහිරට : පාර ද, (H) දකුණට එකී අංක 948 පිඹුරේ ලොට් 4 ද, සහ බටහිරට : එකී පිඹුරේ ලොට් 1 ද මායිම් වන, ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම එකයි තුනක් (අක්. 0, රූඩ් 0, පර්. 3.13) හෝ (හෙක්. 0.0079) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම් කොටස එහි පිහිටි වරිපනම් අංක 611 දරන ගොඩනැගිල්ල සහ අනෙකුත් සියලුම දේ සමග.

බලයලත් මිනින්දෝරු විජිත් සෙල්ලහේවා විසින් මෑතක සාදන ලද 2003 මැයි 02 දාතම හා අංක 671 දරන මිනුම් පිඹුරට අනුව ඉහත කී ඉඩම පහත සඳහන් ආකාරයට විස්තර කර ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල කොට්ඨාසයේ, මහපලාත කෝරලේ, බණ්ඩාරවෙල නගර සභා සීමාව තුළ පිහිටි බදුල්ල පාරේ වරිපනම් අංක 611 දරන අස්වැද්දුමපතන නමින් හැඳින්වෙන ඉහත කී අංක 671 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් නිරූපිත, එකී පිඹුරට අනුව උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. සුමතිරත්න විසින් සාදන ලද අංක 948 පිඹුරේ ලොට් 1 සහ 2 සහ පාර ද ; නැගෙනහිරට : පාර සහ පාර (H) ද දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. සුමතිරත්න විසින් සාදන ලද අංක 948 පිඹුරේ ලොට් 4 ද සහ බටහිරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. සුමතිරත්න විසින් සාදන ලද අංක 948 පිඹුරේ ලොට් 1 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම එකයි තුනක් (අක්. 0, රූඩ්. 0, පර්. 3.13) ක් හෝ හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතයි නවයක් (හෙක්. 0.0079) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ ඉඩම් කොටස එහි පිහිටි ගොඩනැගිල්ල සහ අනෙකුත් සියළුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

04-105/2

---

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංකය : 0024 5001 1846.

2005.05.26 දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමේදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව සෙල්බි පාරේ, අංක 3/67 හි වැලිවේරියෙගේ ඇනෙක්ලීටස් රෙමීජියස් මිල්ටන් පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ප්‍රනාන්දුපුල්ලේ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 1999 මැයි 14 දාතම හා අංක 2310 දරන උකස් බැදුම්කරය මත බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2005 ජනවාරි 07 වන දිනට එකී බැදුම්කරය මත ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දොළොස් ලක්ෂ හයදහස් හාරසිය විසි එකයි ශත දහයක් (රු.1,206,421.10) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් දොළොස් ලක්ෂ හයදහස් හාරසීය විසි එකයි ශත දහයක් (රු. 1,206,421.10) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් පන් ලක්ෂ විසිදහසක (රු.520,000) මුදල සඳහා වසරකට සියයට විසිහතර (24%) බැගින් 2005 ජනවාරි 08 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වොතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 2310 දරන බැදුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ මීගමුව මහනගර සභා සීමාව ඇතුළත, කුට්ටිදූව දෙවන කොටසේ පිහිටි, සෙල්බි පාරේ, වරිපනම් අංක 32 දරන, කලින් කුට්ටිදූවවත්තේ ලොට් 1 A වශයෙන් හැඳින්වෙන, දැනට කුඹුක්ගහවත්තේ ලොට් A වශයෙන් හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු ඒ. සී. එස්. ගුණරත්න විසින් සාදන ලද 1996 නොවැම්බර් 19 දාතම හා අංක 4960 දරන පිඹුරට අනුව, උතුරට: කලින් මුහුදු වෙරළද සහ දැනට මාකස් ප්‍රනාන්දු හා මේරි ප්‍රනාන්දුගේ ඉඩමද නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් B ද, දකුණට : සෙල්බි පාර ද බටහිරට : ජේ. වින්සන්ට් ප්‍රනාන්දුගේ ඉඩමද මායිම් වන මීගමුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 261/65 හි ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම පහක් (අක්.0, රූඩ්. 0, පර්. 8.5) වන සෙල්බි පාරේ, වරිපනම් අංක 32 දරන බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සමග.

මෙම ඉඩම දැනට, බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් සාදන ලද 1998 නොවැම්බර් 14, දාතම හා අංක 3255 දරන මෑතක සැකසූ පිඹුරට අනුව උතුරට : ඇන්තනී ප්‍රනාන්දුගේ ඉඩමද නැගෙනහිරට : අඩිපාර සහ සෙල්බි පාරද, දකුණට : සෙල්බි පාර සහ සෙබස්තියන් පෙරේරාගේ ඉඩම ද සහ බටහිරට : සෙබස්තියන් පෙරේරා ගේ ඉඩම සහ ඇන්තනී ප්‍රනාන්දුගේ ඉඩමද වශයෙන් මායිම් වී ඇති ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හතයි පහක් (අක්. 0, රූඩ් 0, පර් 7.75) වන සෙල්බි පාරේ වරිපනම් අංක 32 දරන පරිශ්‍රය එහි පිහිටි ගොඩනැගිලි හා අනෙකුත් සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

04-105/3

---

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0014 5001 0150.

2004.04.29 දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙනියාය, කොලවැනිගම, බෙලිඅත්ත කුඹුර නිසල හි ලියන කංකානම් ගමගේ කරුණාවතී යන අය බන්ධනදායී වශයෙන්, මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. හේවාවිතාරණ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2002 මැයි 03 දාතම හා අංක 323 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, එකී බැඳුම්කරය මත 2004 ජනවාරි 22 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පත් ලක්ෂ අසූපත් දහස් නවසිය තුනයි ශත පනස් හතක (රු.585,903.57) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පත්ලක්ෂ අසූපත් දහස් නවසිය තුනයි ශත පනස් හතක (රු. 585,903.57) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හාර ලක්ෂ හතලිස් හත් දහස් පන්සියයක (රු. 447,500) මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් 2004 ජනවාරි 23 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 323 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය මහනුවර, බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මොරවක කෝරලේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ කොටපොළ පිහිටි, මලදිගේදෙනියගාවහේන නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු අයි. කොට්ටඹගේ විසින් සාදන ලද 1997 මැයි 16 දාතම හා අංක 1806 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු එම්. පී. කුඩාහෙට්ටි විසින් සාදන ලද 1958 අගෝස්තු 12 දාතම හා අංක 1010 (මාතර දි. උ. 1269/P ) දරන ලොට් C වශයෙන් නිරූපිත ඉඩමේ ප්‍රතිමූණුමකි) නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති. කොටපොල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිකාව G 2/309 හි ලියා පදිංචි කොට ඇති එකී අංක 1806 දරන පිඹුරට අනුව, උතුරට : එකී අංක 1010 පිඹුරේ ලොට් B ද නැගෙනහිරට : පැලවත්තේ දෙනිය ද දකුණට : එකී අංක 1010 පිඹුරේ ලොට් D ද, සහ බටහිරට : දෙනියාය සිට අකුරැස්ස දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයද මායිම වන ප්‍රමාණයෙන් පර්චස් තිස්තුනයි දශම හයයි හතරක්(අක්. 0, රූඩ්0, පර්. 33.64) හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි පහක් (හෙක්. 0.085) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම් කොටස එහි ඇති ගොඩනැගිලි, ගහකොල, වගාවන් සහ අනෙකුත් සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

04-105/1

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය.

ණය අංකය : 04/0/00/00946.

ණයකරුගේ සම්පූර්ණ නම : මල්ලියවඩුගේ ඩයිවාන් සිල්වා.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එෆ්. ඩබ්. ඒ. ඒ. ඩබ්. එම්. පිස්ලින් විසින් ලියා සහතික කරන ලද අංක 251 හා 1998.07.03 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, එකී උකස්බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අනූහත්දාස් තුන්සිය අනූහතයි ශත හැටතුනක (රු.197,397.63) මුදලක් වර්ෂ 2002.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හතලිස්හත්දාස් දෙසීය පනස්පහයි ශත අනූහයක (රු.147,255.96) මුදලද වර්ෂ 2002.02.28 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්දාස් එකසිය හතලිස්එකයි ශත හැටහතක් (රු.50,141.67) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ අනූහත්දාස් තුන්සිය අනූහතයි ශත හැටතුනක්ද (රු.197,397.63)

(2) එකී රුපියල් එක්ලක්ෂ හතලිස්හත්දාස් දෙසීය පනස් පහයි ශත අනූහයක් (රු.147,255.96) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.71% බැගින් වන පොලියක්, 2002.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු කේ. පී. එන්. සිල්වා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### දේපල පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, මැදසියපත්තුව, වල්ගම විගුහුම්පොල පිහිටි කළුගලතැන්න වත්ත නැමැති ඉඩමට 1998.01.06 දින කේ. එම්. එච්. නවරත්න මානකවරයා විසින් අඳින ලද 10051 පිඹුර ප්‍රකාර ඉඩමට මායිම් උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද දකුණට : වී. සී. පාර ද බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහනමයයි දශම පහක (අක්. 0, රූ. 0, පර්. 19.5) වපසරියකින් යුතු ඉඩම හා ඊට අයත් සියළු දේද මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ එම් 490/275 හි ලියාපදිංචි කොට ඇත.

වර්ෂ 2002 ක් වූ අප්‍රේල් මස 25 වන දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

04-108

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහ පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි ÷

| | රු. | ශ. |
|---|---|---|
| අභලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අභලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අභලේ සෑම කොටසකටම සම්පූර්ණ අභලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ඨශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රයඛ පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ රු. | ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර ඨකොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2005 | | | |
| අප්‍රේල් | 2006.04.07 | සිකුරාදා | 2006.03.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.04.12 | බදාදා | 2006.03.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.04.21 | සිකුරාදා | 2006.04.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.04.28 | සිකුරාදා | 2006.04.12 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2006.05.05 | සිකුරාදා | 2006.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.11 | බ්‍රහස්පතින්දා | 2006.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.19 | සිකුරාදා | 2006.05.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.26 | සිකුරාදා | 2006.05.11 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| ජුනි | 2006.06.02 | සිකුරාදා | 2006.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.09 | සිකුරාදා | 2006.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.16 | සිකුරාදා | 2006.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.23 | සිකුරාදා | 2006.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.30 | සිකුරාදා | 2006.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.